## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ,ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.1.1 සහ 1.2 ඡේදවල දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.1.1 **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලන සමාගම වු සීමාසහිත ඕෂන් වීව් ඩිවලොප්මන්ට් සමාගමේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) 1991 දෙසම්බර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ වු ව්‍යාපෘතියක් ලෙස ස්ථාපනය කරන ලදී. මේ අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශනද ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වලට ඒකාබද්ධ කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් 49% ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වුවත් බැංකුවේ කටයුතු වලට ප්‍රමාණවත් බලපෑමක් කිරීමට අධිකාරියට නොහැකි වීම හේතුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 27 අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.2 <u>මූල්‍ය පකාශන පිළිබඳ අදහස් දැක්වීම්</u>

1.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ප්‍රමිත අංක 12 ට අනුව ශේෂපත්‍ර දිනට පසුව සිදුවන සදුවීම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු නමුත් අධිකාරිය යටතේ ව්‍යාපෘතියක් ලෙස ස්ථාපනය කොට තිබූ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සහ එහි සියළුම වත්කම් හා වගකීම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතට පත්කිරීම සඳහා 2011 ජනවාරි 26 දිනැති හා අංක 11/0089/517/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී තිබියදීත්, එම තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 16 ට අනුව අධිකාරිය හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු මිලියන 454.87 ක් හා රු මිලියන 72.64 ක් පාර්තෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන සලසා තිබුණද, අනාගතයේදී සිදුවන පාර්තෝෂික ගෙවීම් අවස්ථා වලදී ඒ සඳහා යොදා ගැනීමට හැකිවන පරිද රු මිලියන 7.977 ක් පමණක් බාහිරව ආයෝජනය කර තිබුණි.

1.2.2 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් සටහන් අංක 3 ට අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ තොගය ගණනය කිරීමේදී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට ගණනය කරන බව සඳහන් වුවද, ජාතික යන්ත්‍රෝපකරණ ඒකකය සාමාන්‍ය බර තැබීම් ක්‍රමයට තොගය ගණනය කිරීම කර ඇති බැවින් රු 1,221,206 ක තොග විචලනයක් සිදුවී තිබුණි.

(ආ) ගිණුම් සටහන් අංක 10 ට අනුව වන්දි ගෙවීමෙන් තොරව සහ නිවාස අරමුණක් වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගන්නා විට එකතුව රු 234,420,998 ක් වූ ඉඩම්වල වෙළඳපොල අගය සහ ඒ වෙනුවෙන් දරන ලද මූලික වියදම් ඉඩම් අත්පත් කර ගැනීමේ සංචිත අරමුදලකට මාරු කළ යුතු වුවත්, එවැනි සංචිත අරමුදලක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දේපළ අංශයේ වාර්තා පරිදි අධිකාරියට අයත් ඉඩම් හෙක්ටයාර් 943 ක් පමණ තක්සෙරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ජාතික යන්ත්‍රෝපකරණ ඒකකයේ නැතිවී ඇති වටිනාකම රු 7,847,054 ක් වූ යන්ත්‍ර 08 ක් සඳහා වූ හානිය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් මූල්‍ය ප්‍රකාශන වල කර නොතිබුණි.

(ඇ) හිඹුටාන උයන නිවාස විකුණුම් ලාභය ගණනය කිරීමේදී රු 3,265,000 කට විකුණන ලද නිවාස 02 ක විකුණුම් වටිනාකම රු 2,183,993 ක් ලෙස ගෙන තිබූ අතර ඉන් එක් නිවසක පිරිවැය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඈ) GTZ ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු මෝටර් සයිකල් 05 ක හා ඩබල් කැබ් රථයක වටිනාකම ඇස්තමේන්තු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඉ) වැඩ අවසන් වූ ව්‍යාපෘති 03 කට අදාලව ලැබී තිබුණු රු මිලියන 46.67 ක මුදල් පිරිවැයට එරෙහිව ගැලපීම වෙනුවට තවදුරටත් ණය හිමි ලෙජරයේ ඉදිරියට ගෙන ගොස් තිබුණි.

(ඊ) ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ රු මිලියන 0.84 ක් වටිනා ඉඩම් හා නිවාස විකුණුම් වල පිරිවැය හඳුනා නොගැනීම හේතුවෙන් ලාභයට ගැලපීමකින් තොරව 2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල වෙන්කිරීම් යටතේ දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු රක්ෂණ වන්දි ලෙස රු 177,622 ක් වැඩිපුර ගිණුම් ගතකර තිබුණි.

(ඌ) නිවාස ඉදිකිරීම් පිරිවැය දැරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් සහ පශු සම්පත් මණ්ඩලයෙන් ලැබී තිබුණ රු මිලියන 10.84 ක මුදල් වසර 05 ඉක්මවා තිබියදීත් ගිණුම් වල අවශ්‍ය ගැලපීම් නොකර තැන්පතු යටතේ දක්වා තිබුණි.

(එ) රු මිලියන 5.15 ක ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා මහාභාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මුදල් ,ඉදිකිරීම් පිරිවැය සඳහා ලැබූ තැන්පත් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඒ) 2009 වර්ෂයේ ගලහ නිවාස යෝජනා ක්‍රමය සඳහා වැයකරන ලද මුදල් රු මිලියන 2.67 ක් තැන්පතු ගිණුමට හරකර තිබූ නමුත් එවැනි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඔ) ජාතික යන්ත්‍රෝපකරණ ඒකකයට ප්‍රදාන ලෙස ජපන් ආධාර යටතේ ලැබුණු රු 986,769,757 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ක්ෂය වෙන්කිරීම් කර නොතිබුණි.

(ඕ) උතුරු නැගෙනහිර දිස්ත්‍රිත් කාර්යාල දෙකෙහි නැතිවුණු මෝටර් සයිකල් 08 ක හා ජීප් රථයක වටිනාකම පිළිවෙලින් රු 400,000 ක් හා රු 112,864 ක් වු අතර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

1.2.4 <u>අනුචිත හෙළිදරව් කිරීම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොටසක් ඉදිකර විවිධ හේතුන් මත අතහැර දමා තිබුණු නිවාස යෝජනා ක්‍රම 03 ක වියදම වු රු. මිලියන 47 ක් කෙර් ගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර තිබුණු නමුත් එම මුදල රීල් සමාගමෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් වල දක්වා නොතිබුණි.

(ආ) විකිණීම සම්පුර්ණ කර තිබුණු ඉඩම්වල විකුණුම් වටිනාකම හා නිවාස වල වටිනාකම පිළිවෙලින් රු මිලියන 1,010.38 ක් හා රු මිලියන 135.66 ක් ඉඩම් විකුණුම් තැන්පතු හා නිවාස විකණුම්, තැන්පතු ලෙස ගිණුම් ගත කර තිබුණි. පිරිවැය හදුනා ගෙන ගිණුම් ගැලපීම් කරන බව සභාපති දැනුම් දි ඇත.

(ඇ) ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් වියදම් ලෙස රු 1,106,176 ක මුදලක් කෙර්ගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. නමුත් එම දිස්ත්‍රික් කාර්යාලයේ ඉදකිරීම් අතර මගදි නවතා දමා තිබුණි.

(ඈ) එකතුව රු මිලියන 5.53 ක් වු වැඩ නිමි ව්‍යාපෘති වලට අදාල ඉදිකිරීම් පිරිවැය වත්කම් ගිණුම් වලට මාරු නොකර කෙර්ගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

1.2.5 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු මිලියන 54.63 ක් ලෙස ගිණුම්වල දක්වා ඇති ණයගැති ශේෂවල නිවැරදිතාවය සම්බන්ධයෙන් අදාල ආයතන සමග එකගතාවයකට පත් වී නොතිබුණු අතර රු මිලියන 51.8 ක ණය ශේෂ ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි බව නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි.

(ආ) කළුතර දිස්ත්‍රක් කාර්යාලයේ වතු නිවාස වැඩසටහන යටතේ ණය ලබාදීම සඳහා ජාතිය ගොඩ නැගීමේ හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් ලද මුදලින් රු 1,355,000 ක මුදලක් වසර 03 ක සිට වතු නිවාස වැඩසටහනට නොගෙවා රඳවා ගෙන තිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට ණය ගැති ශේෂය රු 1,669,695,942 ක් වූ අතර ඒතුල වර්ෂ 03 ඉක්මවූ රු 504,222,572 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

1.2.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

රුපියල් මිලියන 942.82 ක් වටිනා පහත සඳහන් ගිණුම් විෂයයන් 02 කට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම රු මිලියන | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ජාතික යන්ත්‍රෝපකරණ ඒකකය | | |
| අ) ප්‍රදාන ලෙස ලැබූ වත්කම් | 937.44 | විස්තරාත්මක උපලේඛන |
| ආ) අත්තිකාරම් | <u>5.38</u> | කාල විශ්ලේෂණය |
| එකතුව | 942.82 | |
| | ==== | |

1.2.7 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| 2007 මැයි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2007 | විශ්‍රාමික නිළධාරීන් නැවත සේවයේ යොදවා ගැනීමේදී චක්‍රලේඛය ප්‍රකාරව අවසාන වරට ලබාගත් වැටුපෙන් 50% ක් පමණක් දීමනාව වශයෙන් ගෙවිය යුතු වුවද, නිළධාරීන් 43 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු 2,707,028 ක් වැඩිපුර ගෙවාතිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහය | |
| 11 පරිච්ඡේදයේ 13.1 (ආ) | තනතුරක වැඩ බැලීමට පත්කිරීම සඳහා පත්කිරීම් බලධාරියාගේ අනුමැතය අවශ්‍ය වුවද, නිළධාරීන් 43 ක් සඳහා එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 16 වගන්තිය | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් සමාලෝචිත වසරේ ගෙවිය යුතු සේවක අරථසාධක අරමුදල් නියමිත කාලයට ප්‍රේෂණය නොකිරීම මත පනවා තිබූ රු1,578,964 ක අධිභාරය 2010 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා නොතිබුණි. |

1.2.8 අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

සභාධිපත්‍ය දේපළ අළුත්වැඩියාවන් හා වැඩි දියුණු කිරීම් සඳහා මහාභාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු මිලියන 45 ක මුදලින් රු මිලියන 10.9 ක් කළමනාකරණ සංස්ථා ස්ථාපනය නොකිරීම හේතුවෙන් නිවාස යෝජනා ක්‍රමවල පවිත්‍රතා කටයුතු හා පොම්පාගාර නඩත්තුව (ක්‍රියා කරවීම) සඳහා වැයකර තිබුණි.

2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය සමාලෝචනය

2.1.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ කටයුතු , යන්ත්‍රෝපකරණ ආයතනයේ සහ පර්පාලත සමාගමේ මූල්‍ය ප්‍රතිඵල ඉකුත් වර්ෂ හතරක් සමග සසඳා පහත දැක්වේ.

| ආයතනය | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| | රු මිලියන | රු මිලියන | රු මිලියන | රු මිලියන | රු මිලියන |
| අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල පාඩුව | (666.73) | (502.66) | (646.74) | (784.75) | (2,054.88) |
| යන්ත්‍රෝපකරණ ඒකකයේ මෙහෙයුම් වල පාඩුව | (98.15) | (68.25) | (94.46) | (109.55) | (173.64) |
| ඕෂන් වීව් ඩිවලොප්මන්ට් සමාගමේ ලාභය/(පාඩුව) | 9.62 | 12.47 | 15.7 | 26.68 | (13.48) |

2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ 05 තුල අධිකාරිය දිගින් දිගටම විශාල ලෙස පාඩු ලැබීම හේතුවෙන් ශුද්ධ වත්කම් 38% කින් අඩුවී තිබු අතර මෙම තත්ත්වය මත අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම අවදානමකට ලක්ව ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික යන්ත්‍රෝපකරණ ඒකකයේ ජංගම අනුපාතය 1 ට 3.25 ක්ද, ක්ෂණික වත්කම් අනුපාතය 1 ට 7.04 ක් ද වීම නිසා මෙම ඒකකයේද අඛන්ඩ පැවැත්ම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

2.1.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල්තර ව්‍යාපෘතිය යටතේ සාදා නිම කරන ලද රු මිලියන 562.48 ක් වටිනා නිවාස 395 ක් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව පවරා තිබුණ.

(ආ) අධිකාර්යේ නිළධාරීන් 10 දෙනෙකුගෙන් සමන්විත මැණුම් අංශයක් තිබියදී සමාලෝචිත වර්ෂයේදී මැණුම් ගාස්තු වශයෙන් රු 3,723,742 ක මුදලක් බාහිර වෘත්තිකයන් වෙත ගෙවා තිබුණි.
මැණුම් කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්‍යය මණ්ඩලයක් නොමැති බැවින් බාහිර පුද්ගලයන් මගින් මැණුම් කටයුතු සිදුකර ඇති බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) රු 3,150,000 ක පිරිවැය වූ ටොයොටා ලැන්ඩ් ක්‍රෘෂර් රථය සෞඛ්‍ය අමාත්‍යාංශයට භාවිතය සඳහා ලබාදී වසර 10 කට වැඩි කාලයක් ගතවී තිබුණද ඒ සඳහා දරන ලද පිරිවැය හෝ වාහනය නැවත අධිකාර්යට ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) ඇත්නාවල විශේෂ නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 60 ක් ඉදිකිරීමට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රෙඩ් ක්‍රසන්ට් සමාජයට පවරා තිබුණද එයට අදාල ගිවිසුමකට එළඹ නොතිබුණ. පර්චසයක තක්සේරු වටිනාකම රු 7,293 ක් වුවද පර්චසය රු 5,000 ක මුදලකට ලබාදීමට කටයුතු කර තිබුණි.

(ඉ) මට්ටක්කුලිය, කාකදූපත, සීබ්‍රීස් නිවාස යෝජනා ක්‍රමයේ පොදු කටයුතු සඳහා වෙන්කර තිබු අංක 51 දරණ ඉඩම ව්‍යාපාරික කටයුත්තක් සඳහා විකුණා තිබුණු අතර එය අධිකාර්යේ අරමුණු වලට පටහැනි ක්‍රියාවකි.

(ඊ) අධිකාර්යේ ගිණුම් වලට අදාලව සේවා දායකයින්ගේ අත්තිකාරම්, සේවා දායක ණයගිමියන්, සේවා දායක ණය ගැති ශේෂ පිළිවෙලින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාර්ය හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ගිණුම් ශේෂ සමග නොසැසදීම නිසා රු මිලියන 51.77 ක වෙනසක් නිර්ක්ෂණය වු අතර මෙම වෙනස්කම් හඳුනා ගෙන ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් කිරීමට අධිකාර්ය පියවර ගෙන නොතිබුණි.

2.2 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

2.2.1 <u>කාර්ය සාධනය</u>

පහත සඳහන් නිර්ක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වසර තුල නිවාස සෘජු ඉදිකිරීම් වැඩසටහනෙහි ක්‍රියාකාරකම් සිදු නොකර තිබු අතර එහි ඉලක්ක ගත භෞතික කාර්ය සාධනය හා මූල්‍ය කාර්ය සාධනය පිළිවෙලින් ඒකක 88 ක් හා රු මිලියන 187.60 ක් විය.

(ආ) සමාලෝචිත වසර තුල ක්‍රියාත්මක කළ වතු නිවාස වැඩසටහන ,දේපල අයිතිය තහවුරු කිරීම සහ සභාධිපත්‍ය නිවාස ක්‍රම අළුත් වැඩියාව යන වැඩසටහනවල සත්‍ය කාර්ය සාධනය ඉලක්කගත කාර්ය සාධනයෙන් 50% කට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ඇ) නවාස ව්‍යාපෘති 09 ක් ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇතත්, සමාලෝචිත වසර අවසාන වන විටත් ආරම්භ කර තිබුණේ ව්‍යාපෘති 02 ක් පමණි. වසර තුනකට වැඩි කාලයක් ගතවී තිබුණද ව්‍යාපෘති 07 ක් ආරම්භ කිරීමට කටයුතු නොකිරීම නිසා නිවාස ඒකක 1050 කින් ලැබිය යුතු ආදායම අධිකාරියට අහිමිව ගොස් තිබුණි

2.2.2 <u>ව්‍යාපෘති පාලනය</u>

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 117 වත්ත, ඇල්විටිගල මාවත (IV) අදියර පෙර විකුණුම් පදනම මත නිවාස 08 ක් ඉදිකිරීමේ කටයුතු 2008 වසරේ අවසන් කළ යුතු වුවද, සමාලෝචිත වසර අවසාන වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් නොකර තිබූ අතර නිවාස 02 කට අදාලව ගැණුම්කරුවන්ද තෝරාගෙන නොතිබුණි.

(ආ) පල්ලේකැලේ නිවාස ව්‍යාපෘතිය සඳහා 2005 වසරේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව නිවාස 50 ක් ඉදිකිරීමට අනුමැතිය ලැබී ඇතත් නිවාස 25 ක් පමණක් ඉදිකිරීමට ගිවිසුම් අත්සන් කර තිබුණු අතර සමාලෝචිත වසර අවසාන වන විටත් වැඩ නිමවී තිබුනේ නිවාස 11 ක පමණි.

(ඇ) සියනෑඋයන නිවාස ඒකක 72 ක් ඉදිකිරීමේ ව්‍යාපෘති ගිවිසුමේ 17 වගන්තියට අනුව ව්‍යාපෘති කටයුතු 2009 වසර තුල අවසන් විය යුතු වුවත් සමාලෝචිත වසර අවසන් වන විට වැඩ නිමකල නිවාස ගණන 05 ක් පමණක් විය.

2.2.3 <u>**කළමනාකරණ අකාර්යක්ෂමතා**</u>

පහත සඳහන් කළමනාකරණ අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ හිග ණය ශේෂ අයකර ගැනීම සහ එම හිග මුදල් සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරින්ට එරෙහිව ක්‍රියාකිරීමට 2003 අගෝස්තු 31 දින පැවති පොදු ව්‍යපාර පිළිබඳ කාරක සභාව විසින් රාජ්‍ය දේපල පනත යටතේ ක්‍රියාකළ යුතු බවට නියෝග කර තිබුණු නමුත් සමාලෝචිත වසර අවසානයටද රු මිලියන 197.86 ක හිග ණය ශේෂ පැවතුණි.

1992 සිට 2010 ජනවාරි 31 දක්වා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට නීති ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය තත්ත්වයක් නොතිබූ බැවින් ණය අයකර ගැනීමට නීති ක්‍රියා මාර්ග ගෙන නොමැති බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) පසුගිය විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී ඇති පරිදි ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 යි පර්චස් 26.5 කින් යුත් ඉඩම පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් වූ ඒකාබද්ධ ව්‍යාපෘතිය සඳහා යහපත් කළමනාකරණ පරිචයක් අනුගමනය කර නොතිබීම හේතුවෙන් රු මිලියන 1,000 ක පමණ ඇස්තමේන්තුගත අලාභයක් අනාවරණය වී තිබුණි. සමාලෝචිත වසර තුලද මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. මෙම ඉඩම සම්බන්ධව අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ පරීක්ෂණයක් පැවැත්වෙන බව සභාපති දැනුම් දී ඇත.

(ඇ) නිවාස යෝජනා ක්‍රම ඉදිකිරීමට ප්‍රථම අදාල පළාත් පාලන ආයතන මගින් නිවාස සැලසුම් අනුමත කරවා ගතයුතු වුවද, එලෙස කටයුතු නොකර ඉදිකිරීම් කර තිබීම නිසා සමාලෝචිත වසර අවසානය වන විට , නිවාස යෝජනා ක්‍රම 141 කට අදාල නිවාස 3509 ක අනුකූලතා සහතික ලබා ගැනීමේ ගැටළු පැන නැගී තිබුණි.මෙම තත්ත්වය මත කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි වී තිබුණු බැවින් එම නිවාස යෝජනා ක්‍රම වල නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වසර තුලද රු මිලියන 21.97 ක් අධිකාරිය විසින් දරා තිබුණි.

(ඈ) දිවයිනේ පලාත් 08 ක අධිකාරිය සතු දේපලවල අනවසර ඉදිකිරීම් සහිත ඉඩම් හෙක්ටයාර් 208.74 ක් සමාලෝචිත වසර අවසානයට හඳුනාගෙන තිබු නමුත් එම දේපල නිරවුල් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඉ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 526 ක් සඳහා සූර්ය බල පද්ධති ලබා ගැනීම සඳහා ලබාදී තිබූ ණයශේෂය 2010 ජනවාරි 01 දිනට රු 4,248,706 ක් වූ අතර 2010 වර්ෂය තුලදී අයවී තිබුනේ රු 500 ක් පමණි. මෙම ණය අයකර ගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙලක්ද ආයතනය සතුව නොතිබුණි.

### 2.2.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ඩිපෝ 21 ක හා වැඩබිම් 05 ක රු මිලියන 106.25 ක් වූ පිරිවැටුම ඉක්මවා රු මිලියන 145.11 ක මෙහෙයුම් හා නඩත්තු වියදම් දරා තිබුණු අතර ඩිපෝ 03 ක හා එක් වැඩබිමක කිසිඳු ආදායමක් සමාලෝචිත වසර තුලදී උපයා ගෙන නොතිබුණි.

පිරිවැටුම ඉක්මවා මෙහෙයුම් හා නඩත්තු වියදම් වැඩිවීමට හේතුවූයේ ආයතනයේ යන්ත්‍ර සූත්‍ර වර්ෂ 18 ක් පමණ පැරණි බැවින් නඩත්තු පිරිවැය ඉහල මට්ටමක පැවතීම බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ආ) නිවාස අරමුණු සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් පවරා ගත් /පවරා ගැනීමට තිබුණු ඉඩම් දල වශයෙන් හෙක්ටයාර් 4,948 ක් පමණ වු අතර සමාලෝචිත වසර අවසාන වන විටත් මෙම ඉඩම් වලට අදාල ඉඩම් ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි. බොහෝ ඉඩම් ප්‍රමාණයක අනවසර පදිංචිවීම් ඇති බවටද නිරීක්ෂණය විය.

(ඇ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් පිළිවෙලින් රු 14,381,122 ක් හා රු 9,589,970 ක බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට හෝ හිළවි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් පිළිවෙලින් රු 15,028,977 ක් හා රු 41,269,298 ක බදු මුදල් සමාලෝචිත වසර අවසාන වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 <u>නිවාස ණය පාලනය</u>

(අ) <u>නිවාස සංවර්ධන අධිකාරිය</u>

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් අනුව රු මිලියන 2,647.52 ක ණයගැති ශේෂයක් හා රු මිලියන 2,558.32 ක ණය ප්‍රාග්ධනයක් පැවති අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අවසානයට රු මිලියන 2,738.32 ක හා රු මිලියන 2,647.52 ක ශේෂ පැවතිණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වසර තුල සත්‍ය අයකිරීම් රු මිලියන 811.46 ක් වු අතර එය අයවැයගත අයවීම් ප්‍රමාණයෙන් 65% ක් පමණ විය. එමෙන්ම සත්‍ය අයකිරීම් මුළු ණයගැතියන්ගෙන් ප්‍රතිශතයක් ලෙස 30.64% ක් ලෙස පහල අගයක් ගෙන තිබුණි.

(ii) අධිකාරිය විසින් අයවැය ගත අයකිරීම් ප්‍රමාණය තීරණය කිරීමේදී සැලකිල්ලට භාජනය කර ඇත්තේ මුළු ණයගැති ශේෂයෙන් 46.83% ක් බැවින් එය ණය කළමනාකරණයේ දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය විය.

(iii) ණය රු 100 ක් එකතු කිරීම සඳහා රු 5 ක පමණ පිරිවැයක් දරා තිබුණද මුළු ණයගැති සංඛ්‍යාවෙන් වසර 03 ට වැඩි ණයගැති සංඛ්‍යාව 88% ක් වී ඇති අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වසර තුළදී මෙම ණය අයවීමේ ප්‍රමාණය 2% ක් පමණක් විය.

(ආ) <u>ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය</u>

(i) වටිනාකම රු මිලියන 197.86 ක හිඟ ණය අයකර ගැනීම සම්බන්ධව ප්‍රමාණවත් පියවර සමාලෝචිත වසර තුළද ගෙන නොතිබුණි.

(ii) මුළු සේවා ණයගැති ශේෂය රු මිලියන 197.86 ක් වූ අතර එයින් 76% ක්වූ වර්ෂ 5 ඉක්මවූ ණය ශේෂ සඳහා බොල් ණය හා අඩමාන ණය වශයෙන් රු මිලියන 171 ක් ප්‍රතිපාදනය කර තිබුණි.එම ප්‍රමාණය මුළු ණය ශේෂයෙන් 86% ක් විය.

2.2.6 <u>ආර්ථික නොවූ ගණුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වසර අවසාන වන විටත් ජනාධිපති අරමුදලට ගෙවිය යුතුව පැවති ණය ශේෂය රු මිලියන 195 ක් වූ අතර එයට අදාලව 15% ක වාර්ෂික පොලිය මත ගෙවිය යුතු මුළු පොලී මුදල රු මිලියන 198 ක් විය. අධිකාරිය විසින් ඉහල පොලී අනුපාතයක් ගෙවන මෙම ණය මුදල ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඔරුගොඩවත්ත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා රු මිලියන 39.9 ක් අධිකාරිය විසින් වියදම් කිරීමෙන් අනතුරුව අතහැර දමා තිබුණු අතර සමාලෝචිත වසර අවසාන වන විටත් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 <u>අධිකාරියේ සම්පත් වෙනත් රාජ්‍ය ආයතන වෙත සැපයීම</u>

අංක පීඊඩී/12 හා 2003 ජුනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයේ විධානයන්ට පටහැනිව රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහරින ලද සේවකයින් 10 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 1.28 ක් වැටුප් හා දීමනා ලෙස අධිකාරිය විසින් දරා තිබුණ අතර වාහන 03 ක් රේඛීය අමාත්‍යාංශයට හා වාහන 05 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවටද එක් වාහනයක් සෞඛ්‍ය අමාත්‍යාංශයටද ලබාදී තිබුණි.

2.2.8 <u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාළිගාවත්ත දිස්ත්‍රික් කාර්යාලයට අයත් ගොඩනැගිලි 04 ක් වසර 1 1/2 සිට වසර 05 දක්වා කාල සීමාව තුල භාවිතයට නොගෙන තිබුණි. තවද, ඉන් එක් ගොඩනැගිල්ලක් භාවිතයට නොගැනීම හේතුවෙන් දිරා පත්වෙමින් තිබුණි.කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නිවාසලාභීන් ඉදිරිපත් නොවීම මීට හේතුවී ඇති බව සභාපති දැනම් දී ඇත.

.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ වැඩබිම් 01 ක් හා ඩිපෝ 05 ක මෙහෙයුම් කටයුතු මුළුමනින්ම නවතා තිබු නමත් එම වැඩබිම් හා ඩිපෝවල සේවක පඩිනඩි සහ නඩත්තු වියදම් වශයෙන් රු 19,174,272 ක් වැයකර තිබුණි.

2.2.9 <u>හඳුනා ගන්නා ලද පාඩු</u>

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යාපනය දිස්ත්‍රික් කාර්යාලය විසින් සමුපකාර ණයදෙන සමිති නිවාස ණය ක්‍රමය (ටීසීසීඑස්) යටතේ ලබාදුන් රු 5,965,000 ක් වටිනා නිවාස ණය 1,468 ක ලිපිගොනු අස්ථාන ගතවීම හේතුවෙන් එම ණය මුදල් අයකර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි. යුද්ධය හේතුවෙන් සිවිල් ජනතාව වෙනත් ප්‍රදේශ වල පදිංචියට යාම මීට හේතුවු බව සභාපති දැනුම් දී ඇත.

(ආ) නිවාස සංවර්ධන අධිකාර ගොඩනැගිල්ලේ මහල් කිහිපයක් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට කුලියට දී ඇති අතර මුල් බදු කුලී තක්සේරුව අඩු කිරම නිසා සමාලෝචිත වසර අවසානයට රු මිලියන 13.29 ක සමුච්චිත බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) අවිස්සාවේල්ල මාණික්කාවත්ත ව්‍යාපෘතියේ නිවාස 100 ක් ඉදිකිරීම වෙනුවෙන් 2008 වසරේදී අධිකාරිය රු මිලියන 76.07 ක් වියදම් කර තිබුණු අතර ඉන් නිවාස 75 ක් විකිණීම සඳහා ගිවිසුමකට එළඹීමකින් තොරව නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට භාරදී තිබුණි. සමාලෝචිත වසර අවසාන වන විටත් ගිවිසුමට එළඹීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මේ වෙනුවෙන් රු මිලියන 41.2 ක් පමණක් බැංකුවෙන් ඉල්ලා තිබීම මත ව්‍යාපෘතියෙන් රු මිලියන 20.2 ක පාඩුවක් සිදුවී තිබුණි.

2.2.10 <u>මානව සම්පත් කළමනාකරණය</u>

අධිකාරියේ මානව සම්පත් සැලැස්මට අනුව අනුමත කාර්‍ය්‍ය මණ්ඩලය 2493 ක් ලෙස සඳහන් වුවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ කාර්‍ය්‍ය මණ්ඩලය 1376 ක් පමණක් විය. නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට සත්‍ය කාර්‍ය්‍ය මණ්ඩලය 1990 ක් වූ බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉකමවා සේවකයින් 614 ක් සිටින බවට නිරීක්ෂණය විය.

2.2.11 <u>සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම</u>

2007 දෙසැම්බර් 18 දිනැති PED/47 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අධිකාරිය වර්ෂ 05 ක් සඳහා සංයුක්ත සැලැස්මක් හා එය ඉටුකර ගැනීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද යාවත් කාලීන කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වසරට අදාලව සංයුක්ත සැලසුම හා ක්‍රියාකාරී සැලසුම සැසදීමේදී ඉලක්කගත වැඩ සටහන් වලට අදාල භෞතික හා මූල්‍ය දත්ත අතර පිළිවෙලින් ඒකක 4774 ක් හා රු මිලියන 1612.10 වෙනස්කම් නිරීක්ෂණය විය.

2.2.12 <u>අභ්‍යන්තර විගණනය</u>

සමාලෝචිත වර්ෂයේ විගණන වැඩසටහනේ ඇතුලත් ක්ෂේත්‍ර රැසක් විගණනයට ලක්වී නොතිබුණු අතර ඇතැම් දිස්ත්‍රික් කාර්යාල පසුගිය වර්ෂ කිහිපයක් තුල විගණනයට භාජනය කර නොතිබුණි.

2.2.13 <u>අයවැය ලේඛනමය පාලනය</u>

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පිළිවෙලින් රු මිලියන 444.23 ක් හා රු මිලියන 1,030.08 ක තථ්‍ය ආදායම හා වියදම සහ රු මිලියන 871.84 හා රු මිලියන 1,070.68 ක අයවැය ගත සංඛ්‍යා සමග සැසදීමේදී ආදායම රු මිලියන 427.61 කින් හා වියදම රු මිලියන 40.6 ක වෙනස්කම් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගත් බවක් නිරීක්ෂණය නොවිය.

3 **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ණය ලබාදීම
(ආ) කුවිතාන්සි පොත්
(ඇ) ගබඩා
(ඈ) කොන්ත්‍රාත්
(ඉ) අත්තිකාරම්
(ඊ) සේවක මණ්ඩල
(උ) බැංකු මුදල්
(ඌ) වැටි බදු ගණනය